# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1789/10 - 2012 දෙසැම්බර් මස 17 වැනි සඳුදා - 2012.12.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**පඩිපාලක සහා ආඥාපනත**

රබර් වැවීමේ හා දළ රබර් නිපදවීමේ කර්මාන්තය

**7 වන වගන්තිය යටතේ නිවේදනයයි**

කම්කරු අමාත්‍ය ගාමිණී ලොකුගේ වන මම (136 වන අධිකාරය) පඩිපාලක සහා ආඥාපනතේ 6(1) වගන්තිය යටතේ රබර් වැවීමේ හා දළ රබර් නිපදවීමේ කර්මාන්තය පිළිබඳව ආඥාවන් පැනවීමට අදහස් කරන බව පඩිපාලක සහා ආඥා පනතේ 7(1) වගන්තිය යටතේ මෙයින් නිවේදනය කරමි.

මෙම යෝජිත ආඥාවට යම් විරෝධතාවන් ඇතොත් එම විරෝධතාවයන් 2013 ජනවාරි 09 දින දහවල් 12.00 දක්වා මවිසින් භාර ගනු ලැබේ.

එසේ එවනු ලබන සෑම විරෝධතාවක්ම ලිඛිතව ඉදිරිපත් කල යුතු අතර, ඒ විරෝධතාවන්ට හේතු වූ කරුණු පිළිබඳව ප්‍රකාශයන්ද එහි ඇතුලත් විය යුතුය.

ගාමිණී ලොකුගේ,
කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය.

2012 නොවැම්බර් මස 20 දින,
කොළඹ 05,
කම්කරු දෙපාර්තමේන්තුවේ දී ය.

*ආඥාව*

පඩිපාලක සහා ආඥා පනතේ (136 වන ඡේදය) 2 කොටසේ විධිවිධාන පහත දැක්වෙන කර්මාන්තයට ගැනෙන්නේය. රබර් වැවීමේ හා දළ රබර් නිපදවීමේ කර්මාන්තය එනම්,

(1) අක්කර දහයක් හෝ ඊට වඩා වැඩි ප්‍රමාණයේ රබර් වගාවක් හදාවඩා ගැනීම හා සාත්තු සප්පායම් කිරීම ;

(2) අලෙවි කිරීම සඳහා දළ රබර් නිපදවීම (ශාඛයෙන් ලබා ගන්නා රබර් කිරි, නිමි භාණ්ඩ නිෂ්පාදනයට ගත හැකි ලෙස වෙනස් කිරීම).

මෙම කර්මාන්තයේ පහත උපලේඛනයේ සඳහන් කාර්යයන්හී නියෙලෙන සේවකයින්ගේ කාර්යයන් මීට ඇතුළත් වේ.

*උපලේඛනය*

1.1 රබර් වගාව හදාවඩා ගැනීම හා නඩත්තු කිරීමේ යෙදී සිටින සේවකයින්

* අස්වනු සහායකයින් ;
* විවිධ වැඩ සහායකයින්.

අස්වනු සහායකයින්ගේ කාර්යභාරය

කිරි කැපීම, කිරි හා ඔට්ටපාළු එකතු කිරීම, කිරි හා ඔට්ටපාළු එකතු කරන ස්ථාන කරා ගෙන ඒම, බර මැනීම සඳහා සහාය වීම, කිරි කැපීම් සිදු කරන ස්ථානය සකස් කිරීම, වැහි ආවරණ වල ආරක්ෂාව, රසායනික ද්‍රව්‍ය ආලේපනය.

විවිධ වැඩ සහයකයින්ගේ කාර්යභාරය -

පැල තවාන් වල සියළු වැඩ කටයුතු (අංකුර බද්ධ කිරීම ඇතුලත්ව), බිම් සැකසීම, මාර්ග හා පාලම් ඉදි කිරීම, සීමාවල් සකස් කිරීම හා වැටවල් බැඳීම, පාංශු සංරක්ෂණය, කාණු දැමීම හා අළුත් වැඩියාව, පැල සිටුවීම, වල් නෙලීම (අතින්/රසායනික ද්‍රව්‍ය භාවිතයෙන්), කොල පෝර යෙදීම. කිරි කැපීමට ගස් ගණන් කිරීම හා සලකුණු යෙදීම, කෘමිනාශක විදීම හා රෝග සම්බන්ධ වැඩ, කිරි කැපුම් කරන ගස් මැනවින් නඩත්තු කිරීම, වැහි ආවරණ සවි කිරීම, කිරි කැපීම සිදු කල ස්ථානය මැනවින් තබා ගැනීම, පිරිසිදු කිරීමේ කටයුතු, ආරක්ෂක (මුරකරු), කණ්ඩායම් අධීක්ෂක (කංකානි).

2.1 අලෙවි කිරීම සඳහා ද දල රබර් නිපදවීමේ (දුම් ගැසු රොටි) ක්‍රේප් රබර්. කේන්ද්‍රාපසාරි රබර්, (Tecnically Specified Rubber) යෙදී සිටින පහත සේවකයන්.

රබර් කිරි එකතු කිරීමේ ටැංකි වෙත ප්‍රවාහනය, භාගීකරණය (කොටස්වලට වෙන් කිරීම) යොද ඉවත් කිරීම සහ කිරි කැටි ගැසීම, රබර් කිරි මුදවීමේ ක්‍රියාවලිය, දල රබර් සම්බන්ධයෙන් ක්‍රියා කිරීම සහ නඩත්තුව සහ කිරි සකස් කිරීමේ යාන්ත්‍රණය, රබර් ෂීට් හා ලේස් රබර් සම්බන්ධව කටයුතු, සියළුම වර්ගවල අමු රබර් තේරීම, නොම්මර කිරීම සහ පැක් කිරීම, කිරි එකතු කරන උපකරණ, ටැංකි, කර්මාන්ත ශාලා පරිශ්‍රය, ප්‍රවාහන රථ පිරිසිදු කිරීම, වියලීමේ කුළුනු, බොයිලේරු ආදී උපකරණ ක්‍රියා කිරීම සහ නඩත්තුව, දර කැපීම, රබර් වත්තක/කර්මාන්ත ශාලාවක අපවිත්‍ර ජලය පිරිසිදු කිරීමේ බලාගාරය ක්‍රියාත්මක කිරීම හා නඩත්තුව, කේන්ද්‍රාපසාරි කිරි නිෂ්පාදනය මගින් කිරිවල ගුණාත්මක භාවය විශ්ලේෂණය කිරීම.

ඉහත උපලේඛණයේ සඳහන් නොවුවද රබර් වැවීම හා දල රබර් නිපදවීමට අදාළ අනුශාංගික කාර්යයන්හි නියැලෙන සේවකයන්ද මෙයින් ආවරණ වේ.

නමුත් පහත දැක්වෙන සේවකයන්ගේ කාර්යයන් ඇතුළත් නොවේ.

රබර් සාදන්නන් ඇන්ජින් ඩ්‍රයිවර්, ලොරි හා වෑන් ඩ්‍රයිවර්, ලිපිකරුවන්, කොන්දොස්තර, කනකපුල්ලේ ගබඩාකාර, චිකිත්සක, ආයම්මා, බංගලා සේවක, රෙදි අපුල්ලන්නන්, බාබර් ගුරුවරයා, වාට්ටු සේවක.

01 - 14

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.